කොළඹ විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී ප්‍රථම වසර උපාධි පරීක්ෂණය
සෙමෙස්තර අවසාන පරීක්ෂණය, පළමු සෙමෙස්තරය - 2023/2024

# CCA 1101 – සන්නිවේදන ප්‍රවේශය

ප්‍රශ්න තුනකට (03) පමණක් පිළිතුරු සපයන්න. කාලය පැය 02 යි.

01. 'භාෂාව යනු මිනිසුන් සමාජීය සමූහයක සාමාජිකයන් ද, සංස්කෘතියක කොටස්කරුවන් ද වශයෙන් අන්‍යෝන්‍ය ක්‍රියාකාරිතා හා සන්නිවේදනය සඳහා යොදාගන්නා සම්මුතික වූ වාක් සංකේත පද්ධතියකි.' මානව භාෂාවේ ස්වලක්ෂණ හඳුන්වා දෙමින් පැහැදිලි කරන්න.

02. පෘථුල අවකාශයක විහිදුණු මානව භාව ප්‍රකාශන විවිධ වූ අවාචික සන්නිවේදන ප්‍රකාර මගින් සන්නිවේදනය කෙරෙන ආකාරය නිදර්ශන සහිත ව විස්තර කරන්න.

03. පුද්ගලාන්තර සන්නිවේදනය හා සංසන්දනාත්මක ව සලකා ජනසන්නිවේදනයෙහි සුවිශේෂතාව ඊට අයත් ප්‍රබලතා පෙන්වා දෙමින් විවරණය කරන්න.

04. 'හුදු විඥාපනය ඉක්මවා ගිය පෘථුල කාර්ය සමුදායක් සමකාලීන සමාජයෙහි සන්නිවේදනය මගින් අපේක්ෂා කරනු ලැබේ.' සන්නිවේදන කාර්ය කෙරෙහි සාවධාන ව විග්‍රහ කරන්න.

05. සන්නිවේදනයෙහි මූලිකාංග හඳුන්වා සන්නිවේදන ක්‍රියාවලිය තුළ ඒවායේ අන්තර්ක්‍රියාකාරිත්වය එක් එක් සන්නිවේදන මූලිකාංගවල කාර්යභාරයට විශේෂිත ව පැහැදිලි කරන්න.

06. ජාත්‍යන්තර සන්නිවේදනය සැකෙවින් හඳුන්වා දී දේශීය මාධ්‍ය සංස්කෘතිය කෙරෙහි එහි බලපෑම කවරාකාරදැයි උදාහරණ සහිත ව විස්තර කරන්න.

07. පහත සඳහන් මාතෘකා අතරින් **හතරක් (04)** තෝරාගෙන කෙටි සටහන් ලියන්න.

අ. සන්නිවේදන අධ්‍යයනයෙහි සමාරම්භක අවධිය (Beginning of the study of communication)

ආ. සත්ව සන්නිවේදනයෙහි ස්වලක්ෂණ (Characteristics of animal communication)

ඇ. භාෂාව හා නිර්මාණශීලීත්වය (Language and creativity)

ඈ. කණ්ඩායම් සන්නිවේදනය (Group communication)

ඉ. සන්නිවේදන බාධක (Barriers of Communication)

ඊ. සන්නිවේදන ආකෘති හා ඒවායේ මුඛ්‍ය සංරචක (Communication models and their key components)

*********************